# ජාතික සුපිලිපන් ප්‍රනාම ලාභීන් දූෂණය පිටු දැකීමේ ක්‍රියාවලිය ප්‍රබෝධමත් කිරීමට

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රීලංකා ආයතනය විසින් අඛන්ඩව 4වන වරටත් එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර දූෂණය පිටු දැකීමේ දිනය 2007 දෙසැම්බර් 9වන දින බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී සමරණ ලදී. මෙම අවස්ථාවේදී ප්‍රධාන අමුත්තා වූයේ අවංකත්වයේ හා සුපිලිපන්බවේ ඉතා පැහැදිලි පැතිකඩක් වන ආචාර්ය කිරන් බෙඩි මහත්මියයි. ගෞරවනීය ආරාධිතයා වූයේ අල්ලස් සහ දූෂණ විමර්ෂන කොමිසමේ සභාපති අමිර් ඉස්මයිල් විනිශ්වයකාර තුමායි. පොලොන්නරුව නවගිරිදාමර විදුහලෙහි අති දක්ෂ සිසුවියක් වන රන්මැනිකේ අධිකාරී මෙනෙවිය ගෞරවනීය ආරාධිත අමුත්තා ලෙස මෙහිදී කැපී පෙනුණි.

මෙම ජාතික සුපිලිපන් ප්‍රනාමයන්හි ප්‍රධාන අරමුණු වනුයේ දූෂණයට එරෙහිව පෞද්ගලිකව සටන් වදින්නවුන්ගේ නිර්භීතකම සහ අධිශ්ඨානශීලිත්වය හඳුනාගෙන එම සුවිශේෂ පුද්ගලයින් දූෂණය පිටු දැකීමේ ක්‍රියාවලිය ප්‍රබෝධමත් කිරීමේ ප්‍රභවයන් බවට පත්කිරීමයි. මෙවැනි පුද්ගලයින් තම ජීවිත වලට සහ වෘත්තීමය තනතුරු වෙත එල්ල වන්නා වූ දරුණු තර්ජන මධ්‍යයේ වුවද ඉතා වැදගත් භූමිකාවක් රඟපායි.

2007 ජාතික සුපිලිපන් ප්‍රනාමලාභී එස් කේ ලියනගේ මහතා පැවසවේ

*"මහ ජනතාව අද පාරට බැස රැකියා ඉල්ලා උද්ගෝෂණය කිරීම වෙනුවට දූෂණය අතුගා දැමීම සඳහා හඬ නැගිය යුතුයි. අද අපට දූෂණයෙන් තොර රටක් ඇත්නම් අනිවාර්‍යයෙන්ම වැඩි රැකියා අවස්ථාවන්ද නිර්මානය වනු ඇත".*

ඔහු මෙම ප්‍රනාමයෙන් පිදුම් ලද්දේ 33 වසරක් පුරා සිවිල් සේවකයෙකු වශයෙන් දූෂණයට එරෙහිව කරණ ලද දැවැන්ත කැපවීම අගය කිරීමක් වශයෙනුයි.

ශ්‍රීලංකා වරාය අධිකාරියේ දූෂණයට එරෙහිව නොබිය සටනක් ගෙනගිය ශ්‍යාමලා ෆර්නාන්දු මහත්මියද මෙවර ජාතික සුපිලිපන් ප්‍රනාමයෙන් පිදුම් ලැබුවේ විශේෂ සඳහන් කිරීමක්ද සමඟයි.

ජයග්‍රහකයින්ට තම ප්‍රනාම ප්‍රධානය කලේ ආචාර්ය කිරන් බෙඩි මහත්මියයි. ඇය ඉන්දියාවේ ප්‍රථම කාන්තා බන්ධනාගාර කොමසාරිස් ජෙනරාල් වරියයි. තම සේවා කාලය තුල නොයෙකුත් සම්මාන ඇය විසින් දිනාගත් අතර එයින් ප්‍රධන වන්නේ ආසියානු නෝබල් ත්‍යාගය ලෙස සැලකෙන සුප්‍රසිද්ධ රාමොන් මැග්සේසේ සම්මානය 1994 වසර සඳහා දිනා ගැනීමයි.

ආචාර්ය බෙඩි මහත්මිය අවධාරණය කලේ

*"දූෂණය පිටු දැකීමේ ක්‍රියාවලියෙහි ප්‍රථම පියවර ලෙස සැලකිය හැක්කේ තොරතුරු ලබා ගැනීමේ අයිතිය වෙනුවෙන් සටන් කිරීම සඳහා සංවිධානයක් ගොඩනගා ගැනීම වන අතර ඒ සඳහා සිවිල් සමාජය පෙරමුණ ගත යුතුයි. දූෂණයෙන් ප්‍රධාන වශයෙන් පීඩනයට පත්වන්නේ කාන්තාවන් සහ දරුවන්ය".*

මෙහිදී කිරන් බෙඩී මහත්මිය ප්‍රනාම ලාභින්ගෙන් ඉල්ලා සිටියේ මෙතෙක් කල් ඔවුන් විසින් කරගෙන ආ දූෂණයට එරෙහි සටන අඛන්ඩව ඉදිරියටත් කරගෙන යන ලෙසයි. ඇය ශ්‍රීලංකාවේ සිවිල් සමාජ නායකයින්ගෙන් ඉල්ලා සිටියේ ඉතා ශක්තිමත් සංවිධානයක් මේ සඳහා ගොඩනගාගන්නා ලෙසයි. මෙහිදී ඇය පෙන්වා දුන්නේ ශ්‍රීලංකාව මැග්සේසේ සම්මාන ලාභීන් 6 දෙනෙකු මෙතෙක් බිහි කර ඇති බවයි.

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රීලංකා ආයතනයෙහි විධායක අධ්‍යක්ෂක ජේ සී වැලිඅමුණ මහතා මෙසේ පැවසීය.

*"නාම යෝජනා 53ක් අප වෙත ලැබුනු අතර ජාතික සුපිලිපන් ප්‍රනාම ලාභීන් තෝරාගනු ලැබුයේ ස්වාධීන නිරීක්ෂකයින් කන්ඩායමක් විසින් ඉතා පාරදෘශ්‍ය ක්‍රමවේදයක් මාර්ගයෙනුයි."*

මෙම අවස්ථාවේදී *යහපාලනයේ තත්වය-2007* වාර්ථාවද එලි දක්වන ලදී මෙහිදී ට්‍රාන්ස්පේරන්සි ආයතනයේ නියෝජ්‍ය විධායක අධ්‍යක්ෂක රුකෂන නානායක්කාර මහතා මෙසේ පැවසීය.

*"අප ආයතනය මෙවැනි වාර්ථාවක් එලි දැක් වූ ප්‍රථම අවස්ථාව මෙයයි.මින්මතු මෙය සෑම වසරකදීම සිදුවනු ඇත. මෙම 2007 යහපාලන වාර්ථාව 2007 වසරෙහි යහපාලනය පිලිබඳ සිද්ධීන් ඉස්මතු කොට ඇත".*

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රීලංකා විසින් ලෝක දූෂණය පිටු දැකීමේ දිනය සැමරීම සඳහා දරුවන් මුල් කොටගත් විශේෂ වැඩ සටහනකටද දායක විය. මෙහි අරමුණ වූයේ වැඩිහිටියන් මෙන්ම අප අනාගත වැඩිහිටියන් වන දරු පරපුරද දූෂනය හා සම්බන්ධ කාරණා පිලිබඳ වැඩි අවබෝධයක් ලබා එමගින් තම අනන්‍යතාවය ගෞරවනීය පුරවැසියන් ලෙස ගොඩනගා ගැනීම සහ එතුලින් තම වැඩිහිටියන්ටද බලපෑමක් ඇති කිරීමයි. මෙම වැඩ සටහනට සහාය දැක්වූයේ දරුවන්ගේ අයිතීන් ජාත්‍යන්තර සමාගමේ අධ්‍යක්ෂක ආචාර්ය චාරිකා මුනසිංහයි. මෙහිදී පලාත් 5 කින් පැමිණි දරුවන් 53 ක් තමන් නියොජනය කරණ සගයින් 750ක් වෙනුවෙන් සුපිලිපන්බවේ හඩනගන ලදි. සුපිලිපන්බවෙන් සපිරි ජාතියක් ගොඩනැගීම සඳහා මෙම දරුවන් ඉදිරිපත් කල අදහස් වැඩිහිටියන්ට මෙන්ම අදාල අදිකාරීන්ටද ඉදිරිපත් කරනු ලැබුයේ ඒ පිලිබඳ ඔවුන් ඉදිරිපත් කල යෝජනාද සමගිනි.

මෙම උත්සවයන් දෙකටම විවිධ තල වලට අයත් විශාල පිරිසක් සහභාගී විය. ඔවුන් පෞද්ගලික අංශය ව්‍යාපාර අංශය, රාජ්‍ය අංශය මෙන්ම මාධ්‍ය, ප්‍රජා මූලාශ්‍රිත සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන, වෘත්තිය සමිති සංවිධාන සහ පැවිදි යනඅංශ වලට අයත් විය.

උත්සවය අවසානයේදී සවස් වරුවේ පැමිණ සිටි සෑම අයෙකුම ජාතික සුපිලිපන් ප්‍රතිඥාව දුන්නෝය. මෙය සාදනු ලැබුයේ එක්සත් ජාතීන්ගේ දූෂණය පිටු දැකීමේ දිනය සැමරීම පිනිස පවත්වනලද ජාතික සුපිලිපන් ප්‍රතිඥා තරගය මගිනි.